අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/2/29/18/27/01

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2025.10. 28

චක්‍රලේඛ අංකය - 32/2025

සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

**<u>ගුරු උපදේශක සේවයේ පළමුවන කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධවයි</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 2182/36 හා 2020.07.01 දිනැති ගුරු උපදේශක සේවා ව්‍යවස්ථා සංග්‍රහය අනුව ගුරු උපදේශක සේවයේ 2 වන පන්තියට බඳවා ගනු ලබන හෝ අන්තර්ග්‍රහණය කරනු ලබන සෑම ගුරු උපදේශක සේවයේ නිලධරයෙකුම එම බඳවා ගැනීමෙන්/අන්තර්ග්‍රහණයෙන් වසර 05 ක් ඉක්මවීමට පෙර එකී සේවා ව්‍යවස්ථාවේ 08 වගන්තියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවය සම්පූර්ණ කල යුතු වේ.

02. උක්ත සේවා ව්‍යවස්ථාව අනුව 2022.01.02 දින සිට ගුරු උපදේශක සේවයේ 2 පන්තියට අන්තර්ග්‍රහණය කරන ලද සෑම ගුරු උපදේශක සේවයේ නිලධරයෙකුම ගුරු උපදේශක සේවා ව්‍යවස්ථාවේ "අ" පරිශිෂ්ඨයේ සඳහන් පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළව තම අධ්‍යාපන කලාපය/කොට්ඨාශය/පාසලක් පදනම් කරගත් යෝජනාවක්/ගැටළුවක් සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පත් කරනු ලබන කමිටුවක් වෙත පර්යේෂණ නිබන්ධනයක් ඉදිරිපත් කළ යුතු වේ.

03. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත්කළ යුතු කමිටුවේ සංයුතිය මගේ සමාංක හා 2025.01.24 දිනැති ලිපිය මඟින් සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත දන්වා ඇත. එම කමිටුව සඳහා පත් කරනු ලබන විෂය අධ්‍යක්ෂවරයා, පළාතේ පවතින එක් එක් ගුරු උපදේශක විෂයයන්ට අදාළ වන පරිදි කමිටුවට පත් කළ යුතු වේ. මෙලෙස පත් කළ යුතු විෂය අධ්‍යක්ෂවරයා අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරා ඇති පුද්ගලයකු විය යුතුය.

04. ඒ අනුව ගුරු උපදේශක සේවයේ නිලධරයන් විසින් ඉදිරිපත් කල යුතු පර්යේෂණ නිබන්ධනය පිළිබඳව නිර්ණායක පහත පරිදි වේ.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

**කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා සම්පූර්ණ කල යුතු පර්යේෂණ නිබන්ධනය සැකසීම පිළිබඳ වන නිර්ණායක**

01.පළමු වන පරිච්ඡේදය

❖ **හැඳින්වීම**

➢ **පර්යේෂණයේ පසුබිම**

සිදු කිරීමට අපේක්ෂිත පර්යේෂණය කුමක්ද යන්න සහ එය වැදගත් වන්නේ ඇයි ද යන්න පැහැදිලි කිරීමෙන් ආරම්භ කළ යුතුය. මාතෘකාව තේරුම් ගැනීමට උපකාරී වන ආකාරයෙන් සන්දර්භය සැපයිය යුතු වේ.

➢ **පර්යේෂණ ගැටළුව**

පර්යේෂණයෙන් විසඳීමට උත්සාහ කරන අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් හා අවධානය යොමු කළ යුතු ප්‍රධාන ප්‍රශ්නය හෝ ගැටළුව පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙමඟින් අධ්‍යයනයෙන්/පර්යේෂණයෙන් නිර්දේශ ලබාදීමට හෝ විමර්ශනය කිරීමට අපේක්ෂා කරන ගැටළුව පිළිබඳව පැහැදිලි වේ.

➢ **පර්යේෂණ අරමුණු**

හඳුනාගත් ගැටළුව විසඳීමට හෝ ගැටළුව විසඳීම සඳහා නිර්දේශ ලබාදීම වෙනුවෙන් පර්යේෂණය තුළින් ඉටු කර ගැනීමට බලාපොරොත්තුවන ඉලක්ක මොනවාදැයි පිළිවෙලට ලැයිස්තු ගත කළ යුතුය. මේවා පර්යේෂණයෙන් ඉටු කරගැනීමට බලාපොරොත්තු වන නිශ්චිත ඉලක්ක විය යුතුය.

➢ **තාර්කිකය**

පර්යේෂණයක තාර්කිකය යනු, පර්යේෂණය සිදු කිරීමට හේතුව, අරමුණ හෝ සාධාරණීකරණය පැහැදිලි කරන ප්‍රකාශයකි. මෙම පර්යේෂණය වැදගත් වන්නේ ඇයි, එමඟින් සපුරාලීමට උත්සහ කරන දැනුම පරතරය කුමක්ද සහ එය පවතින දැනුමට හෝ භාවිතයට දායක වන ආකාරය ගෙනහැර දැක්විය යුතු වේ.

➢ **අධ්‍යනයේ වැදගත්කම**

පර්යේෂණය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීම හා පර්යේෂණය අදාළ ක්ෂේත්‍රයේ වෙනසකට දායකවන ආකාරය හෝ එයින් ලබාදිය හැකි නව දැනුම පිළිබඳව සාකච්ඡා කළ යුතුය.

**02.** දෙවන පරිච්ඡේදය

➢ **පර්යේෂණ සාහිත්‍ය විමර්ශනය**

පර්යේෂණ මාතෘකාවට අදාළ වෙනත් පර්යේෂණ, ශාස්ත්‍රීය ලිපි, පොත්පත් සහ වාර්තා වැනි මූලාශ්‍ර පරිශීලනය කර කරුණු රැස් කර සාරාංශයක් ඉදිරිපත් කළ යුතුය. මාතෘකාවට අදාළ න්‍යාය හා පෙර අධ්‍යනවලින් අනාවරණය කරගත් කරුණු සහ ඒවා පර්යේෂණයට සම්බන්ධ වන්නේ කෙසේද යන්න ඉස්මතු කර දැක්විය යුතුය.

**03.** තුන්වන පරිච්ඡේදය

❖ **පර්යේෂණ ක්‍රමවේදය**

➢ **පර්යේෂණ ප්‍රශ්නය**

ප්‍රධාන පර්යේෂණ ප්‍රශ්නය වගන්තියක් ලෙස හෝ වාක්‍ය කිහිපයක් යොදා ගනිමින් සඳහන් කළ යුතුය.

➢ **පර්යේෂණ ප්‍රවේශය, ක්‍රමය**

පර්යේෂණය සිදු කරන ආකාරය හෝ මඟ පෙන්වන සමස්ත සැලැස්ම හෝ උපාය මාර්ගයයි. එය දැනුම පිළිබඳ පර්යේෂකයා සතු විශ්වාසයන් පිළිබිඹු කරන අතර, භාවිත කරන දත්ත වර්ගය, එය රැස් කරන ආකාරය සහ එය අර්ථකථනය කරන ආකාරය ඇතුළත් වේ. මේ සඳහා භාවිත කරන ප්‍රධාන ප්‍රවේශ වන්නේ,

- ප්‍රමාණාත්මක
- ගුණාත්මක
- මිශ්‍ර

ප්‍රවේශවලින් එකකි.

නිදසුනක් ලෙස,

සම්මුඛ පරීක්ෂණ හරහා ශිෂ්‍ය අභිප්‍රේරණය අධ්‍යනය කරන්නේ නම්, එම පර්යේෂණයේ ප්‍රවේශය ගුණාත්මක වේ. පර්යේෂණ ක්‍රමවේදය යනු දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ අර්ථ නිරූපණය කිරීම සඳහා පර්යේෂණයේ දී භාවිත කරන ක්‍රම, මෙවලම් සහ ක්‍රියා පටිපාටිවල ක්‍රමානුකූල රාමුවයි. එයට පර්යේෂණයේ සැලසුම, දත්ත රැස් කිරීම සඳහා ශිල්පීය ක්‍රම (උදා : සමීක්ෂණ, අත්හදා බැලීම්) සහ දත්ත විශ්ලේෂණය කරන ආකාරය (උදා : සංඛ්‍යානමය විශ්ලේෂණය, තේමාත්මක කේතනය) ඇතුළත් වේ.

නිදසුනක් ලෙස,

ප්‍රශ්නාවලියක් භාවිත කර ප්‍රතිචාර සංඛ්‍යානමය වශයෙන් විශ්ලේෂණය කරන්නේ නම්, එම ක්‍රමවේදයට සමීක්ෂණ ක්‍රම සහ ප්‍රමාණාත්මක විශ්ලේෂණයන් ඇතුළත් වේ.

➢ **නියැදිය**

පර්යේෂණය සඳහා අධ්‍යනයට ලක් කළ නියැදිය විස්තර කළ යුතුය. එසේම සහභාගීවන්නන් හෝ දත්ත මූලාශ්‍ර තෝරා ගත් ආකාරය පැහැදිලි කළ යුතුය.

➢ **දත්ත රැස් කිරීම.**

පර්යේෂණ සඳහා තොරතුරු රැස්කළ ආකාරය පැහැදිලි කළ යුතුය. මෙයට සමීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, ප්‍රශ්නාවලි හෝ වෙනත් දත්ත රැස්කිරීමේ ක්‍රම ඇතුළත් විය හැකිය.

➢ **දත්ත විශ්ලේෂණය**

පර්යේෂණය සඳහා රැස් කරන දත්ත නිවැරදිව විශ්ලේෂණය කර අර්ථකථනය කළ ආකාරය විස්තර කළ යුතුය. එහිදී දත්ත විශ්ලේෂණය කිරීමට භාවිත කරන ක්‍රම මෙයට ඇතුළත් විය යුතුය.

➢ **පර්යේෂණ සීමා**

සිදු කරනු ලබන පර්යේෂණයෙන් ආවරණය කරන සහ ආවරණය නොකරන දේ විස්තර කළ යුතු වේ. එහිදී පර්යේෂකයාට මුහුණ දීමට සිදුවිය හැකි සීමා හෝ අභියෝග සඳහන් කළ යුතුය.

➢ **පර්යේෂණ ආචාර්ය ධර්ම**

පර්යේෂණය සඳහා සහභාගීවන්නන්ගෙන් කැමැත්ත ලබා ගැනීම සහ ඔවුන්ගේ තොරතුරු රහසිගතව තබා ගැනීම වැනි පර්යේෂණයේ ආචාර්ය ධර්මානුකූල සළකා බැලීම සාකච්ඡා කළ යුතුය.

**04. හතර වන පරිච්ඡේදය**

➢ **දත්ත විශ්ලේෂණය/අනාවරණ හා සාකච්ඡා,**

පර්යේෂණ අනාවරණ පැහැදිලි සහ සංවිධානාත්මක ලෙස ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා වගු, ප්‍රස්ථාර, පෙළ වැනි විවිධ ක්‍රම ශිල්ප භාවිත කළ හැකිය.
පර්යේෂණ ප්‍රශ්නයට අදාළව ප්‍රතිඵල වලින් පිළිඹිබු කරන්නේ කුමක් ද යන්න පැහැදිළි කර එම අනාවරණවල වැදගත්කම පිළිබඳව සාකච්ඡා කළ යුතු වේ. තවද, ඒවා පර්යේෂණ ප්‍රශ්නයට සහ පවතින සාහිත්‍යයට සම්බන්ධ කිරීමද අවශ්‍ය වේ.

**05. පස්වන පරිච්ඡේදය**

➢ **නිගමන හා යෝජනා**

ප්‍රතිඵල අර්ථකථනයේ දී ගොනු කරගත් කරුණු සමඟින් පර්යේෂණ ගැටළුව විසඳීම සඳහා කළයුතු දේ යෝජනා කළ යුතුය. මේවා වැඩිදුර පර්යේෂණ, ප්‍රායෝගික වෙනස්කම් හෝ ප්‍රතිපත්ති යෝජනා විය හැකිය.

**06. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

නිශ්චිත ශෛලියකට අනුකූලව (උදා: APA 7) පර්යේෂණය සඳහා පරිශීලනය කළ මූලාශ්‍ර නාමාවලියක් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.

**07. ඇමුණුම්**

පර්යේෂණයට සහාය වන නමුත් ප්‍රධාන පෙළෙහි කොටසක් නොවන අමතර ද්‍රව්‍ය ඇතුළත් කළ යුතුය. මෙයට ප්‍රශ්නාවලි, අමු දත්ත හෝ සවිස්තර වගු වැනි දෑ ඇතුළත් කළ හැකිය.

**පර්යේෂණ වාර්තාව සැකසීමේ දී භාවිත කළ යුතු තාක්ෂණික උපදෙස්**

අකුරු වර්ගය

| | | |
|---|---|---|
| සිංහල | - | FmAbhaya |
| දෙමළ | - | Kalaham |
| ඉංග්‍රීසි | - | Times New Romen |

අකුරු ප්‍රමාණය

| | | |
|---|---|---|
| ප්‍රධාන මාතෘකා | - | 14 |
| අනු මාතෘකා | - | 12 |
| ඡේද | - | 12 |

**පිටු සැකැස්ම**

| | | |
|---|---|---|
| වම | - | 1.5 |
| දකුණ,උඩ, යට | - | 1.0 |
| පේළි අතර පරතරය | - | 1.5px |

වචන ගණන

| | | |
|---|---|---|
| අවමය | - | 15000 |
| උපරිමය | - | 30000 |

APA 7 මැනුවලයේ ඇති මාර්ගෝපදේශ නිබන්ධනය රචනයේ දී ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය, රූප යෙදීමේ දී උපුටා දැක්වීම් ආදී සියලු පියවරවල දී මෙම මාර්ගෝපදේශ භාවිත කළ යුතුය.

**05. පර්යේෂණ නිබන්ධනය ඉදිරිපත් කිරීම සම්බන්ධ පොදු උපදෙස්**

- නිලධරයා විසින් තෝරා ගනු ලබන පර්යේෂණ මාතෘකාවට අදාලව පර්යේෂණ යෝජනාවක් සකස් කර එය කමිටුව වෙත ඉදිරිපත් කර කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුය. කමිටුව විසින් තම කමිටුව වෙත ඉදිරිපත් වනු ලබන පර්යේෂණ යෝජනාවලිය පරීක්ෂා කර යම් නිවැරදි කිරීම් පවතී නම්, ඒ පිළිබඳව නිලධාරියා දැනුවත් කළ යුතු අතර, පර්යේෂණ යෝජනාව සඳහා මසක් ඇතුලත කමිටුවේ අනුමැතිය ලබා දිය යුතු වේ.
- කමිටුව විසින් අනුමැතිය ලබා දෙන ලද පර්යේෂණ යෝජනාවට අදාල පර්යේෂණ නිබන්ධනය ඉහත සඳහන් නිර්ණායකයන්ට අනුකූලව සකස් කර උපරිමය මාස 11 ක කාලයක් ඇතුලත දී කමිටුව වෙත ඉදිරිපත් කුල යුතු වේ.
- කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන අවසන් පර්යේෂණ නිබන්ධනය කමිටුව විසින් ඇමුණුම 01 මගින් දක්වා ඇති ආකෘතියට අනුකූලව ඇගයීමට ලක් කළ යුතු අතර නියමිත ප්‍රමිතියට පර්යේෂණ නිබන්ධනය ඉදිරිපත් කර ඇත්නම් එය පිළිගත් බවට වන ලිපියක් ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව අදාළ ගුරු උපදේශකවරයා වෙත කමිටු සාමාජිකයන්ගේ අත්සනින් ලබා දිය යුතු වේ.

- නියමිත නිර්ණායකයන්ට අනුකූල නොවන පරිදි ඉදිරිපත් කර ඇති පර්යේෂණ වාර්තා නැවත නිසි පරිදි ඉදිරිපත් කිරීම සඳහා නිලධාරියා වෙත භාර දිය යුතු අතර අදාල නිලධාරියා විසින් එම පර්යේෂණ වාර්තා නියමිත නිර්ණායක අනුව සකස් කර මාස 03 ක් ඇතුලත නැවත කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.
- කමිටුව වෙත ඉදිරිපත් වන අවසන් පර්යේෂණ වාර්තා ඇගයීමට ලක් කර මාස 03 ක් ඇතුලත කමිටුවේ තීරණය ලබා දිය යුතු වේ.

06. පර්යේෂණ නිබන්ධනය සකස් කර ඉදිරිපත් කිරීම පිළිබඳ කාල රාමුව

| අනු අංකය | කාරණය | කාලය |
|---|---|---|
| 01. | පර්යේෂණ යෝජනාව කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම | 2025.11.01 සිට 2025.11.30 දක්වා (මාස 01 ක් තුළ) |
| 02. | පර්යේෂණ නිබන්ධනය සකස් කර කමිටුව වෙත ඉදිරිපත් කිරීම | 2025.12.01 සිට 2026.11.30 දක්වා (මාස 11) තුළ |
| 03. | පර්යේෂණ වාර්තාව ඇගයීම කර කමිටුවේ නිර්දේශ ලබා දීම | 2026.11.30 සිට 2027.02.28 (මාස 03) |

නාලක කලුවැව
ලේකම්

## ..................... නිලධාරීන් විසින් කාර්යක්ෂමතා කඩඉම සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ වාර්තාව ඇගයීම

නිලධාරියාගේ නම: ................................ දෙපාර්තමේන්තුව:..........................................
තනතුර: ..........................................
ඉදිරිපත් කළ දිනය: ..........................................
පර්යේෂණ මාතෘකාව: ..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

| අංක | ඇගයීම් නිර්ණායක | ලකුණු | | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| | | ලබාදෙනු ලබන | ලබාගත් | |
| 01 | මාතෘකාව | 05 | | |
| 02 | හැඳින්වීම<br>• පසුබිම<br>• පර්යේෂණ ගැටළුව/ ගැටළු ප්‍රකාශය<br>• තාර්කික විවරණය | 15 | | |
| 03 | සාහිත්‍ය විවරණය | 15 | | |
| 04 | පර්යේෂණ ක්‍රමවේදය<br>• පර්යේෂණ ප්‍රවේශය<br>• ජනගහනය/ නියැදිය/ නියැදි ප්‍රමාණය/ නියැදි ක්‍රමය<br>• පර්යේෂණ සන්දර්භය | 20 | | |
| 05 | දත්ත රැස්කිරීමේ ක්‍රම | 15 | | |
| 06 | දත්ත විශ්ලේෂණය | 15 | | |
| 07 | සදාචාරාත්මක සලකා බැලීම් | 05 | | |
| 08 | යොමු/ යොමු ලැයිස්තුව/ උපුටා දැක්වීම් | 10 | | |
| 09 | එකතුව | 100 | | |

අදහස්.........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................
..........................................................................................

තීරණය

| ඇගයුම්කරුගේ නම | තීරණය (නිර්දේශ කළ හැක/ නිර්දේශ කළ නොහැක) | අත්සන/ දිනය |
|---|---|---|
| | | |

ඇමුණුම 02

(නිලධාරියාගේ නම)

(නිලධාරියාගේ තනතුර)

(කළාපය)

ගුරු උපදේශක සේවයේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 2182/36 හා 2020.07.01 දිනැති ගුරු උපදේශක සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වන ඡේදයේ සඳහන් පරිදි ගුරු උපදේශක සේවයේ II වන පන්තියේ නිලධාරියකු විසින් සම්පූර්ණ කළ යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාලව ඔබ විසින් ඉදිරිපත් කරන ලද ....(පර්යේෂණ නිබන්ධනයේ නම)..... පර්යේෂණ නිබන්ධනය මෙම කමිටුව විසින් ඇගයීමට ලක් කරන ලදී.

02. එම පර්යේෂණ නිබන්ධනය නියමිත නිර්ණායකයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති/නියමිත නිර්නායකයන්ට අනුකූලව ඉදිරිපත් කර නොමැති බැවින් මෙම කමිටුව විසින් පිළිගත්/නොපිළිගත් බව මෙයින් දන්වා සිටිමු.

03. ඒ අනුව ගුරු උපදේශක සේවයේ 2 වන පන්තියේ නිලධරයන් විසින් සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය, ඔබ විසින් සම්පූර්ණ කර ඇති/නැති බව කාරුණිකව දන්වා සිටිමි.

| | | |
|---|---|---|
| .................................... | .................................... | .................................... |
| පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br>කමිටු සභාපති | කමිටු සාමාජික 01<br>අදාළ විෂය අධ්‍යක්ෂවරයා | කමිටු සාමාජික 02<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/<br>සහකාර ලේකම්<br>පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය |